# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2317/87 - 2023 පෙබරවාරි මස 03 වැනි සිකුරාදා - 2023.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව නිකුත් කළ අංක 2238/35-2021 ජූලි මස 30 වැනි සිකුරාදා *ගැසට් පත්‍රයේ* නියෝග 3(1) වයඹ පළාතේ ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මා විසින් පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් **වසන්ත කරන්නාගොඩ**,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2023 ජනවාරි මස 30 වැනි දින,
කුරුණෑගල දී ය.

පනතේ 24 වන වගන්තිය යටතේ ක්‍රියා කිරීමට අවශ්‍ය කාලය දීර්ඝ කිරීම.

3. (1) 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු මෙහි මින්මතු ''පනත'' යනුවෙන් හඳුන්වනු ලබන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වන කාර්යය ඉටු කිරීම සඳහා, මේ නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස විසි හතරක වැඩිදුර කාලයක් වයඹ පළාතේ ප්‍රාදේශීය සභා වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

EOG 02 - 0027